අවාසනාවකට, කෙතරම් වැදගත් වුවත් බොහෝ මුස්ලිම්වරු දේව නැමදුමෙන් වැළකී සිටිති. නැමදුමෙහි පරමාර්ථය වනුයේ දෙවියන්වහන්සේ සමඟ වූ සබඳතාව සවිමත් කර ගැනීමත්, ඔහුගේ ආශිර්වාදයන්ට ස්තූති කිරීමත්, ඔහුගේ මහිමය සිහිකිරීමත් ය. ශරීරයට ආහාර හා ජලය වැනි ශාරීරික අවශ්‍යතාවයන් ඇත්තාසේම මනසටත් වන්දනාවන්ගෙන් සමන්විත වූ අධ්‍යාත්මික අවශ්‍යතාවන් ඇත. ඉන් දේව නැමදුම වැදගත් වෙයි. කෙනෙකු මනා ශාරීරික සුවයෙන් පසුවුවත් අධ්‍යාත්මිකව ගත්කළ ඔහු මියගිය කෙනෙකු ලෙස ජීවත්ව සිටිය හැක

දෙවියන්වහන්සේව (අල්ලාහ්ව) මතක්වන පුද්ගලයෙකු හා එසේ නොවන පුද්ගලයෙකු අතර වෙනස ජීවත්වන්නෙකු හා මියගිය තැනැත්තෙකු ට සම වේ.'' යැයි නබි තුමාණෝ පවසා සිටී

දෙවියන්වහන්සේ මෙසේ පවසයි, "විශ්වාසවන්තයිනි! අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාගේ (ආරාධනාවට) සවන් දෙනු. එය ඔබට ජීවය ලබා දෙන්නේය." අල්-කුර්ආනය 8:24

# එහි වැදගත්කම

## දෙවියන්වහන්සේ සමඟ ඍජු සබඳතාව

''කෙනෙකු ඔහුගේ ස්වාමියාට වඩාත්ම සමිප වන්නේ දණ්ඩ නමස්කාරයේදී ය''

නැමදුම ඔබව දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවයක් ඇති කරයි. නැමදුම යන්නෙහි අරාබි අර්ථය (අස්-සලාහ්) ''සම්බන්ධතාවය'' යන අරුථයෙන් සෑදී ඇත්තකි.. දෙවියන්වහන්සේගේ දූතයා (මුහම්මද් නබි තුමාණන් '' ඔබගෙන් යමෙක් නැමදුමට සූදානම් වන්නේ නම්, ඔහු තම ස්වාමියා සමඟ සබඳතාවයක් පවත්වයි. එම නිසා ඔහුට එම කාර්යයට අවධානය යොමුකිරීමට ඉඩ ලබාදෙන්න. එම සබඳතාව බිඳනොදමන්න.'' යැයි පැවසුවේය.

## ඉස්ලාමයේ කුළුණකි

ඉස්ලාම් හි දෙවන ප්‍රධාන කුළුණ වන්නේ දේව නැමදුමයි. මුස්ලිම්වරයෙකුගේ දිවියේ නිරන්තයෙන්ම ඉටුකළ යුතු අනිවාර්ය වගකීමක් වනුයේ එයයි. වාතාවරණය කුමක් වුවත් නැමදුම් දිනපතා අනිවාර්යයෙන්ම ඉටුකළ යුතුය. දෙවියන්වහන්සේ එය සටනේ යෙදී සිටින්නන් හටත් අනිවාර්යය කර ඇත ... ! ඔහු

"ඔබගේ නැමදුම් (පුරුද්ද) තදින් ආරක්ෂා කර ගනු ඔබ (සතුරාට) බිය වුවහොත් ඇවිදිමින් හෝ වාහනය මත හිඳිමින් හෝ නමදිනු." අල්-කුර්ආනය 2:238-9

යුධ සමයේ තත්වය එසේ වෙත් නම් එසේ නොවන අවස්ථාවේදී එය කෙසේ විය යුතු ද ?

## සාර්ථකත්වය නැමදුම් මත රඳා පවති

'' විනිශ්ච දිනයේදී පුද්ගලයෙක්ගෙන් ඔහුගේ ක්‍රියාවන් අතුරින් මුලින්ම ප්‍රශ්න කරනු ලබන්නේ නැමදුම පිළිබඳව යි.

එය නිසි ලෙස ඉටුකර ඇත්නම් ඔහු නිර්දෝශී පුද්ගලයෙකු වේ. එමෙන්ම සාර්ථක හා සුරක්ෂිත අයෙකු වේ . එහෙත් එහි අඩුපාඩු වෙත් නම් ඔහු ඉතා අවාසනාවන්ත පරාජිතයෙකි.'' යැයි නබි තුමාණන් පවසා ඇත.

# එහි වාසිය

## අකුසල් ක්‍රියාවන්ට පළිහකි

දෙවියන්වහන්සේගේ උපකාරය නොමැතිව අකුසලින් ආරක්ෂාවිමට නොහැකිය. දෙවියන්වහන්සේ මෙසේ පවසයි "නියත වශයෙන්ම නැමදුම (කෙනෙකුව) අවමන් ගෙන දෙන හා අධර්මිෂ්ඨ ක්‍රියාවන්ගෙන් වළක්වා හරින්නේය". අල්-කුර්ආනය 29 : 45
ඔබ දෙවියන්වහන්සේ ඉදිරියේ දිනකට පස්වරක් පෙනීසිටීනම් පාපක්‍රියා සඳහා ඉඩක් කෙසේ ලැබෙන්නේ ද ?

## ඔබේ ආත්මය සාරවත් කරයි

නැමදීම, ඔබේ නිර්මාතෘ සමඟ සන්නිවේදනයේ යෙදීමට ඇති ඔබේ ආධ්‍යාත්මික අවශ්‍යතාව සංසිඳුවයි. එය ඔබේ ආත්මය සාමයෙන් හා සතුටින් පුරවාලයි.
දෙවියන්වහන්සේ පවසයි,
"අල්ලාහ්ව (දෙවියන්වහන්සේව) මතක් කිරීම මගින් නිසැකවම ඔබගේ හදවතට තෘප්තිය ලබා දෙනු ඇත ." අල්-කුර්ආනය 13:28

## ඔබව නිරහංකාර කරයි

නැමදුමෙහි දි මුස්ලිම්වරයෙක් ඔහුගේ සිරුරේ උසස්ම හා වැදගත්ම අවයවය වන හිස පොළොව මත තබමින් '' මාගේ අධිපති කෙතරම් අංග සම්පූර්ණ ද? කෙතරම් උසස් ද? '' යැයි පවසයි. එවිට දෙවියන්වහන්සේගේ විශිෂ්ඨත්වය හා ඔබ ඔහුගෙන් යැපෙන බව වැටහීමෙන් ඔබේ උඩඟු බව හා අධිමානය තුරන් වි යයි. ඔහු පවසයි, "නැමදුමෙහි නිහතමානී විශ්වාසවන්තයින් නියත වශයෙ-න්ම ජයග්‍රාහකයින්ය." අල්-කුර්ආනය 23:1-2

මෙය ඔබට අත්විඳිය හැක්කේ නැමදුමෙහි යෙදෙන අවස්ථාවේ පවසන දේ පිළිබදව නිසි අවබෝධයකින් සහ එයට නිහතමානීව අවධානය යොමු කළහෙත් පමණි.

## පාපයන් සෝදා හරියි

සියල්ලන් ම වරදෙහි යෙදෙති, නමුත් දෙවියන්වහන්සේ පාපයන් සෝදා හැරීමේ මාර්ගයක් නැමදුම් තුළින් සළසා දී ඇත
දෙවියන්වහන්සේ පවසයි
"තවද නැමදුම ඉටු කරනු.... නියත වශයෙන්ම දැහැමි ක්‍රියාවන් මගින් පාපතර ක්‍රියාවන් පහ කර හරින්නේය". අල්-කුර්ආනය 11:114

දෙවියන්වහන්සේගේ දූතයාණෝ අලංකාර උදාහරණයක් අනුගාමිකයින් හමුවේ තැබුවේ ය. ''ඔබ යමෙකුගේ නිවසේ දොරටුව ඉදිරියෙන් ගංගාවක් තිබුණේ නම් එහි දිනකට පස්වතාවක් ස්නානය කරත් නම් ඔහු කෙරෙහි කිලිටක් වෙත් ද?'' යැයි ඇසූ විට අනුගාමිකයින් ''නැත'' යැයි පිළිතුරු දුන් විට ''එලෙසින්ම දෙවියන්වහන්සේ පස්වේල් නැමදුමෙන් පාපයන් සෝදා හරියි'' යැයි නබි තුමා පැවසුවේ ය

## ඔබේ ගැටළු විසඳයි

ඔබ දෙවියන්වහන්සේ සමඟ ඔබේ බැඳීම ශක්තිමත් කරගත් විට දෙවියන්වහන්සේ ඔහුගේ අනෙකුත් නිර්මාණයන් සමඟ ඔබේ ඇති බැඳීම් වර්ධනය කර දෙයි. ඉතා බල සම්පන්න වූ ඔහු ඔබේ නැමදුම් හේතුවෙන් ඔබේ ගැටළු සඳහා විසඳුම් සළසයි

දෙවියන්වහන්සේ පවසයි
"ඉවසීම හා නැමදුම මගින් පිහිට පතනු" අල්-කුර්ආනය 2:153

## මුස්ලිම්වරුන්ව එක්සත් කරයි

සමූහ වන්දනය මගින් මුස්ලිම්වරුන් අතරේ සහෝදරත්වය, සම තත්ත්වය හා එකමුතුබව ඇති කරයි. නැමදුම්කරුවන් එක් පෙළට උරින් උර ගැටි කුල ජාති වර්ණ උසස් - පහත් වත් පොහොසත්කම් පවුල් තත්වයන් යනාදි භේදයන් නොසළකා නැඟී සිටිමින් මිනිසුන් අතර වූ බාධක සියල්ල බිඳ දේවනැමදුම හේතුවෙන් එකමුතු වෙති.

# නැමදුම් අත්හැරීම

"ඕ මිනිසුනේ! ඉමහත් ත්‍යාගශීලීභාවයෙන් යුත් ඔබගේ දෙවියන් ගැන ඔබව රවටා දැමුවේ කිමෙක්ද?" අල්-කුර්ආනය 82:6

## ඔබ ඔබේ මැවුම්කරුට අකීකරු වීමකි

ඔබේ පැවැත්මෙහි එකම අරමුණ දෙවියන්වහන්සේට වන්දනය කිරීමයි. නමුත් එයට පිටුපාමින් ඔබ ඔබේ මැවුම්කරුට අකීකරු වන්නේය.
"ඉන්පසු ඔවුන්ගේ ස්ථානයට පත් වූ වෙනත් පරපුරක් නැමදුම අත්හැර දමා ඔවුන්ගේ කාම ආශාවන් අනුගමනය කළහ. එබැවින් ඔවුන්ව නිරයෙහි වීසි කර දමනු ඇත . කවුරුන් තමන්ගේ වරදට පසුතැවිලි වී විශ්වාස කර, දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ව හැර". අල්-කුර්ආනය 19:59-60

"(නිරයේ සිටින මිනිසුන්ගෙන් මෙසේ විමසනු ලබන්නාහ): ඔබව කුමක් මගින් නිරයට ඇතුළු වීමට සැලැස්සුවේද? එවිට ඔවුන් 'අපි නමදින්නන්ගෙන් නොවූවෙමු' යයි පවසනු ඇත . " අල්-කුර්ආනය 74:42-43

## ඔබ ගුණමකුවෙකි

සමිප සබඳතාවයක් ඇතිකරගැනීමට ඔබේ මැවුම්කරු කළ ආරාධනය ඔබ ප්‍රතික්ෂේප කිරීම ඔබගේ මහත් ගුණමකු ක්‍රියාවකි